චක්‍රලේඛ අංකඃ 14/2010/

මගේ අංකඃ ඩබ්/ත.ව.අ.වි/2006
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09
2010.02.22

සියළුම බන්ධනාගාර අධිකාරීන් වෙත,

## තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලීය නේවාසිකයින් 9 හා 10 වගන්ති යටතේ මුදාහැරීම

ඉහත කරුණට අදාලව මගේ අංක 38/80 හා 1981.05.29 දිනැතිවද 07/2006 හා 2006.01.23 දිනැතිවද නිකුත් කර ඇති චක්‍රලේඛ හා සම්බන්ධවයි. එකී අංක 07/2006 චක්‍රලේඛයේ 02 වගන්තිය මින් අවලංගු කර පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

02. 1.සියළුම තරුණ වරදකරුවන් සඳහා පරිවාස නිළධාරි වාර්තා සහිත සමාජ වාර්තා ගොනු සුභසාධක නිළධාරි විසින් පවත්වා ගෙන යා යුතුය.

2. 9 වගන්තිය මත මුදාහරිනන්ගේ පරිපාලනයට සුභසාධක නිළධාරින් විසින්ද, 10 වන වගන්තිය මත මුදාහරිනන්ගේ වසරක පරිපාලන සම්බන්ධීකරණය පශ්චාත් කටයුතු මෙහෙයුම් කළමණාකරු විසින්ද කල යුතු අතර තරුණ වරදකරුවන් මුදාහැරීමට පෙර සූදානම් කටයුතු වලදී පශ්චාත් කටයුතු මෙහෙයුම් කළමණාකරු සුභසාධක නිළධාරි සමඟ සහයෝගයෙන් කටයුතු කල යුතුය.

3. 9 වගන්තිය යටතේ තරුණවරදකරුවන් මුදාහැරීමේදී බලපත්‍ර මත සිරකරුවන් මුදාහැරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රියා පිළිවෙතම අනුගමනය කිරීමට සුභසාධක නිළධාරින්, ජ්‍යෙෂ්ඨ සුභසාධක නිළධාරින් හා අදාල අංශ නිළධාරින් වගබලා ගත යුතුය.

4. මින් ඉදිරියට 9 වගන්තිය යටතේ නිදහස් වන තරුණ වරදකරුවන්ගේ ලිපිගොනුව අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත අනුමැතියට ඉදිරිපත් කිරීමේදී පරිපාලනය භාර සුභසාධක නිළධාරි ලෙස අදාල ක්ෂේත්‍රභාර සුභසාධක නිළධාරි නම් කර එවීම අඹේපුස්ස තරුණවරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලීය අධිකාරි විසින් කල යුතුය.

5. එලෙසම 10 වගන්තිය යටතේ තරුණ වරදකරුවන් නිදහස් වූ වහාම ඉදිරි අධීක්ෂණය ක්‍රියාත්මක කිරීම සඳහා තරුණ වරදකරු නිදහස් කිරීමට අධිකරණ ලේකම් විසින් නිකුත් කර ඇති බලපත්‍රයේ පිටපත, අධිකාරි නිරීක්ෂණ වාර්තා පිටපත සහ බලපත්‍රධාරි කාල පූර්ව නිදහස් කිරීමේ වාර්තා පිටපත බන්ධනාගාර මූලස්ථානයේ පශ්චාත් කටයුතු මෙහෙයුම් කළමණාකරු වෙත එවීමට ආයතන අධිකාරි කටයුතු කල යුතුය.

6. 09,10 වගන්ති යටතේ මුදාහැරීමේදී ස්වේච්ඡා මාර්ගෝපදේශකයෙකුගේ සේවය ලබා ගැනීමටත් පශ්චාත් භාර සේවා සඳහා සිරකරු සුභසාධක සංගමය සහ පශ්චාත් භාර සේවා සංගමයේ සේවය ලබා ගැනීමටත් අදාල නිළධාරින් ක්‍රියා කල යුතුය.

7. තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලීය නිවාස නිවාඩු මණ්ඩල රැස්වීමට පශ්චාත් කටයුතු භාර මෙහෙයුම් කළමණාකරුද සහභාගි විය යුතුය.

වී.ආර්.සිල්වා (ආර්එස්පී, යූඑස්පී, එන්ඩියූ, අයිපි)
මේජර් ජනරාල්
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්